**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය**

**පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානයේ පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම**

**2025 අධ්‍යයන වර්ෂය**

## ❖ දර්ශනපති උපාධි පාඨමාලාව (M.Phil.) (වසර දෙකකි) (SLQF 11)

විෂය ධාරාව : බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/බෞද්ධ ශිෂ්ටාචාරය/බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/ සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ඉංග්‍රීසි

අධ්‍යයන මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව : දේශීය සිසුන් සඳහා - රු. 100,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 1305

***ලියාපදිංචිය සඳහා සුදුසුකම්***

- ඉහත විෂය ධාරාවන්ට අදාළ ව ප්‍රථම පන්ති/දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

  හෝ
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉහත විෂය ධාරාවන්ට අදාළ ව ශාස්ත්‍රපති එක් අවුරුදු උපාධි පාඨමාලාවකින් සමත් වීම.

  හෝ
- වෙනත් ඕනෑම විෂය ධාරාවකින් ප්‍රථම පන්ති/දෙවන පෙළ ඉහළ පන්ති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ ශාස්ත්‍රපති උපාධියක් හෝ ලබා ඇති අපේක්ෂකයෙකු ඉහත විෂය ධාරාවන්ට අදාළව පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. (එහිදී පශ්චාද් උපාධි ඩිප්ලෝමාවට අදාළ විෂය ධාරාවෙන් දර්ශනපති උපාධිය සඳහා ලියාපදිංචි විය හැකි ය.)

  හෝ
- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

***පර්යේෂණ කාලසීමාව***

පර්යේෂණයේ කාලසීමාව ලියාපදිංචි වූ දිනයේ සිට වසර 02කි.

***ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම***

- දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 03කි. ලියාපදිංචියෙන් වර්ෂ පහකට (05) පසුව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.
- යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය දීර්ඝ කර ගත හැකි ය. (දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 03කි)
- අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශක ආචාර්යවරයා මඟින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වරකට එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන්වීමට මාස 03 කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

***පර්යේෂණ නිබන්ධයේ ප්‍රමාණය***

වචන 60,000 කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතුය. එම කෘතිය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතුය.

## ❖ ආචාර්ය උපාධි පාඨමාලාව (Ph.D.) (වසර තුනකි) (SLQF 12)

විෂය ධාරාව : බෞද්ධ දර්ශනය/බෞද්ධ සංස්කෘතිය/බෞද්ධ ශිෂ්ටාචාරය/බෞද්ධ අධ්‍යයනය/සිංහල/පාලි/ සංස්කෘත/පුරාවිද්‍යාව/සමය අධ්‍යයනය හා තුලනාත්මක දර්ශනය/ඉංග්‍රීසි

අධ්‍යයන මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි
පාඨමාලා ගාස්තුව : දේශීය සිසුන් සඳහා - රු. 122,000/-
විදේශීය සිසුන් සඳහා - US$ 1755

## ***ලියාපදිංචිය සඳහා සුදුසුකම්***

- ඉහත විෂය ධාරාවන්ට අදාළ ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර දෙකකට නොඅඩු පර්යේෂණ පශ්චාද් උපාධියක් ලබා තිබීම/ සාමාජීය විද්‍යාපති උපාධියක් (MSSc)/ දර්ශනපති උපාධියක් (M.Phil.) ලබා තිබීම.

  හෝ

- ඉහත සඳහන් සුදුසුකම්වලට සමාන යැයි විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මඟින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.

## ***පර්යේෂණ කාලසීමාව***

පර්යේෂණයේ කාලසීමාව ලියාපදිංචි වූ දිනයේ සිට වසර 03කි.

## ***ලියාපදිංචි කාලය දීර්ඝ කිරීම***

- දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 04කි. ලියාපදිංචියෙන් වර්ෂ හතකට (07) පසුව කිසිදු හේතුවක් මත කාලය දීර්ඝ නොකෙරේ.
- යම් අපේක්ෂකයෙකුට නියමිත කාලය තුළ පර්යේෂණය අවසන් කිරීමට නොහැකි වුවහොත් උපදේශකවරයාගේ නිර්දේශය අනුව කාලය දීර්ඝ කර ගත හැකි ය. (දීර්ඝ කරනු ලබන්නේ උපරිම වර්ෂ 04කි)
- අපේක්ෂකයාගේ ඉල්ලීම උපදේශක ආචාර්යවරයා මඟින් ඉදිරිපත් කළ යුතු ය. කාලය දීර්ඝ කිරීම වලංගු වන්නේ එක් වරකට එක් වසරකට පමණි. එහෙයින් සෑම ලියාපදිංචි වසරක් අවසන්වීමට මාස 03 කට පෙර මෙම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

## ***පර්යේෂණ නිබන්ධයේ ප්‍රමාණය***

වචන 75,000 කට නොඅඩු පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කළ යුතුය. එම කෘතිය අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සමකාලීන දැනුම පුළුල් කරන්නක් මෙන් ම නවතාවකින් යුක්ත වූවක් ද විය යුතුය.

## ***අයදුම්පත් ගාස්තුව :***

දර්ශනපති/ආචාර්ය උපාධි පාඨමාලා - රු. 1000/-

## ***අයදුම් කළ යුතු පිළිවෙළ :***

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම සඳහා දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ගිණුම් අංක **711202** ට **'ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය'** නමින් අදාළ අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ලිපිනයේ පිහිටි කාර්යාලය වෙත පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මඟින් එවීමෙන් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගත හැකි ය. තැපැල් මඟින් අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමග තම නම, ලිපිනය ලියන ලද 9''x4'' ප්‍රමාණයේ රු. 110/ක මුද්දර ඇලවූ කවරයක් ඉහත සඳහන් ලිපිනයට එවිය යුතු ය.

එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ පාඨමාලාවේ නම සඳහන් කර, **'අයදුම්පත්‍ර ලබා ගැනීම'** යනුවෙන් සඳහන් කළ යුතු ය. චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
අංක 214, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**අයදුම්පත්‍ර ගාස්තුව ගෙවීමේ දී අදාළ පාඨමාලාවේ කෙටි නාමය සඳහන් කළ යුතු ය. (M.Phil./Ph.D.)**

අන්තර්ජාලයේ www.bpu.ac.lk දරන විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් ද අයදුම්පත් ලබා ගත හැකි ය. එසේ ලබා ගන්නා අයදුම්පත් විශ්වවිද්‍යාලයට භාරදීමේ දී දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින්, ඉහත ගිණුම් අංකයට අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබා ගන්නා ලදුපත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සැලකිය යුතුයි :**

- **දර්ශනපති/ආචාර්ය උපාධි සඳහා ඉල්ලුම් කරන සියලුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට අයත් MABS 53015 - බුදුසමයේ දාර්ශනික ප්‍රවණතා විෂය පත්‍රය සහ MARM 53065 - පර්යේෂණ ක්‍රමවේදය විෂය පත්‍රය සමත් විය යුතුයි. (ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය හදාරා ඉහත විෂයයන් සම්පූර්ණ කළ අපේක්ෂකයින්ට මෙම කොන්දේසිය අදාළ නොවේ.)**
- **දර්ශනපති/ආචාර්ය උපාධිය සමත්වීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- **දර්ශනපති/ආචාර්ය උපාධි සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයින් පර්යේෂණ මාතෘකාවට අදාළව සකස් කරන ලද නිබන්ධ සැලැස්ම සහ සහතික කරන ලද සහතිකවල ඡායා පිටපත් ද අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.**

දර්ශනපති/ආචාර්ය උපාධි පාඨමාලා සඳහා වසරේ ඕනෑම දිනක දී අයදුම්පත් ලබා ගත හැකි අතර, නිවැරදි ව සම්පූර්ණ කරන ලද අයදුම්පත් වසරේ ඕනෑම දිනක දී ඉහත ලිපිනයට පැමිණ ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවිය හැකිය.

වැඩි විස්තර සඳහා : 0112580609